49

Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 18/05/2021 |
|---|---|---|

පැමිණිලි පාර්ශවය : එල්.පී.ඩී.එන්.ටී.ඩයස් මිය,
ජයවර්ධන ස්ටෝර්ස්, දිවෙල,
පල්ලේගම, කෑගල්ල.

වගඋත්තර පාර්ශවය : 01. වෛද්‍ය අධිකාරි,
කරවනැල්ල මූලික රෝහල.
කරවනැල්ල.

02. දිස්ත්‍රික් වෛද්‍ය නිළධාරී,
දැරණියගල දිසා රෝහල.
දැරණියගල.

03. දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
කෑගල්ල.

04. සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
රත්නපුර.

05. ලේකම්,
සබරගමුව පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය.
පළාත් සභා සංකීර්ණය, නව නගරය, රත්නපුර.

<u>පැමිණිලි අංකය - HRC/K/462/19/A</u>

**පැමිණිල්ලේ සැලකිරීම :-**

ඉහත නම සඳහන් පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමා රාජ්‍ය කළමණාකාර සහකාර සේවයේ III පන්තියේ නිළධාරිනියක



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் } 011-2505451
ෆැක්ස් / தொலைநகல் } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் } sechrcsl@gmail.com

ලෙස 2016/10/17 දින පත්වීමක් ලැබ කරවනැල්ල මූලික රෝහලේ 2018/12/24 දින දක්වා සේවය කළ බවත්, හිටිහැටියේම කෑගල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා 'අධ්‍යක්ෂ විසින් තමා රජයේ මුදල් අවභාවිතය කිරීම යන චෝදනාව යටතේ කරවනැල්ල මූලික රෝහලේ සිට දැරණියගල දිසා රෝහලට 2018/12/26 දින සිට මාරු කරන ලද බවත්, තමා ඊට හේතු විමසූ විට පරීක්ෂණ කටයුතු කර චෝදනා පත්‍රයක් ලබා දෙන බව දන්වා සිටි බවත් නමුත් මෙතෙක් කිසිදු චෝදනා පත්‍රයක් හෝ නිදහසට කරුණු ඉදිරිපත් කිරීමක්ද විමසා නොමැති බවත්, එකී කාලය තුළ තමා වෙතින් යම් වරදක් හෝ විෂමාචාරයක් සිදු වූ බව දැනගත්තේ නම් තමාට අධීක්ෂණ නිළධාරීන් විසින් ඒ බව දැන්වීමට හෝ උපදෙස් ලබා දීමට තිබූ බවත්, තමා දැනුවත්ව එවැනි කිසිදු වරදක් හෝ වංචාවක් සිදුවී නොමැති බවත් සඳහන් කර ඇත. එසේ නමුත් 2018/12/26 දින සිට 2019/09/05 දින දක්වා දැරණියගල දිසා රෝහලේ තමා සේවය කරන ලද නමුත් එදින සිට තමාගේ වැටුප් ගෙවා නොමැති බවත්, වැටුප් ගෙවන ලෙසට 2019/05/31 දිනැතිව අදාළ නිළධාරීන් වෙත අභියාචනයක් ඉදිරිපත් කළද තමාට කිසිදු වැටුපක් හෝ දීමනාවක් ලබා නොදුන් බවත් සඳහන් කර ඇත.

මෙසේ සේවය කරමින් සිටියදී 2019/09/05 දිනැතිව සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් තමාගේ රාජකාරී වැඩ තහනම් කර ඇති බවට හා රජයේ මුදල් අවභාවිතය කර ඇති බවට දැනුම් දී ඇති බවත්, මෙය කරවනැල්ල මූලික රෝහලේ වෛද්‍ය අධිකාරී විසින් පළිගැනීමේ චේතනාවෙන් තමා කෙරෙහි ද්වේශ සහගතව ක්‍රියා කරමින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම මත සිදුකර ඇති බවත් සඳහන් කර ඇත.

ඒ අනුව තමා සේවය කරන ලද 2018/12/01 සිට 2019/09/05 දක්වා කාල සීමාවට අදාළ වැටුප් ගෙවා නොමැති බැවින් තමාට එම වැටුප් ගෙවන ලෙසට අදාළ බලධාරීන්ට දැනුම් දෙන ලෙසත්, තමා කිසියම් වරදක් හෝ විෂමාචාරයක් කර ඇත්නම් ඒ පිළිබඳව ආයතන සංග්‍රහය පරිදි ක්‍රියාකිරීමට අදාළ බලධාරීන් දැනුවත් කරන ලෙසත් මෙම පැමිණිල්ල ඉදිරිපත් කරමින් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.

**වගඋත්තර පාර්ශවීය සැළකිරීම් :-**

පැමිණිල්ලට අදාළ වගඋත්තර පාර්ශවීය සබරගමු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාරිය කරවනැල්ල මූලික රෝහලේ ගිණුම් අංශයේ සේවයේ යෙදී සිටියදී ඉන්ධන අග්‍රිම මුදල් පියවීම ප්‍රමාද කිරීම සම්බන්ධයෙන් කරවනැල්ල මූලික රෝහලේ ගණකාධිකාරී විසින් තමාටද පිටපතක් සහිතව 2018/12/11 දිනැතිව පැමිණිලිකාරිය දැනුවත් කර ඇති බවත්, ඒ අනුව අදාළ ඉන්ධන අග්‍රිමයට අදාළ අත්තිකාරම් මුදල් දින 26 ක් ලඟ තබා ගෙන රජයේ මුදල් අවභාවිතයට පත් කර ඇති බවත්ය.

පසුව කරවනැල්ල මූලික රෝහලේ වෛද්‍ය අධිකාරිගේ 2018/12/17 දිනැති ලිපිය මඟින් මෙම නිළධාරිනිය විධිමත් පරිදි මුදල් කටයුතු භාරදීම සිදුකර නොමැති බැවින් සේප්පුව මුද්‍රා තැබීමට කටයුතු කළ බවත් දන්වා ඇත.

පැමිණිලිකාරියගේ මෙම කටයුතු සම්බන්ධයෙන් මේ වන විට මූලික විමර්ශනයක් සිදුකිරීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2019/02/06 දිනැති ලිපියෙන් මූලික විමර්ශන මණ්ඩලයක් පත් කර ඇති බවත්, එහි වාර්තාව තවමත් ලැබී නොමැති බවත්, පැමිණිලිකාරියගෙන් රජයට අයවිය යුතු මුදල සම්බන්ධයෙන් කඩිනමින් විගණනයක් සිදු කර ඌණතා වී ඇති මුදල ගණනය කර විගණන වාර්තාවක් ලබා දෙන ලෙස ඉල්ලා ඇති බවත් එකී වාර්තාව මෙතෙක් ලැබී නොමැති බවත් සඳහන් කර ඇත.

මෙම පැමිණිලිකාර නිළධාරිනිය අයථා ලෙස රජයේ මුදල් අවභාවිතයක් හෝ විෂමාචාරයක් සිදු කර ඇති බවට නිරීක්ෂණයන් මඟින් පැහැදිලි වූ පසු විනය බලධාරියා වන තමා විසින් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට යටත්ව රාජකාරී වැඩ තහනම් කිරීම සිදුකළ බවත්, තවද රජයට ගෙවිය යුතු මුදල් ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු බවත් දන්වා ඇත.

මෙම නිළධාරිනිය සම්බන්ධයෙන් කරවනැල්ල මූලික රෝහලේ වෛද්‍ය අධිකාරිය විසින් රුවන්වැල්ල පොලිසිය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර, ඒ සම්බන්යෙන් මේ වන විට පොලිස් පරීක්ෂණ සිදුවන බවත්, අදාළ වාර්තාවන් ලැබුණු පසු නිළධාරිනියගේ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් තීරණයක් ගන්නා බවත් වැඩිදුරටත් දක්වා ඇත.

**විමර්ශන හා පරීක්ෂණ කටයුතුවලින් අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකාරිය රාජ්‍ය සේවයේ III වන පංතියේ නිළධාරිනියක වශයෙන් 2016/10/17 දින පත්වීමක් ලැබ එදින සිට කරවනැල්ල මූලික රෝහලේ සේවය කර ඇති අතර, 2018/12/26 දින සිට 2019/09/05 දින දක්වා දැරණියගල දිසා රෝහලේ සේවය කර ඇත.

දැරණියගල දිසා රෝහලේ සේවය කළ මාස 09 ක කාලය සඳහා කිසිදු වැටුපක් ගෙවා නොමැති අතර, වැඩ තහනම් කිරීමක්ද සිදුකර නොමැත.

පැමිණිලිකාරිය රජයේ මුදල් අවභාවිතා කිරීමක් හෝ විෂමාචාරයක් සිදුකර තිබේද යන්න පිළිබඳව ආයතන සංග්‍රහයට අනුව නිසි පරිදි මූලික විමර්ශනයක් සිදුකර ඇති බවද තහවුරු නොවේ.

පැමිණිලිකාරිය රජයේ මුදල් අවභාවිතා කිරීමක් හෝ විෂමාචාරයක් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ආරම්භ කළද පැමිණිලිකාරිය සේවය කළ කාලය සඳහා වැටුප් නොගෙවීමට ආයතන සංග්‍රහය අනුව හැකියාවක් නොමැත.

පැමිණිලිකාරියගේ ක්‍රියා කලාපය හේතුවෙන් රජයට අයවිය යුතු මුදලක් තිබේද යන්න පිළිබඳව නිශ්චිත කර ගැනීම සඳහා මු.රෙ.104 යටතේ පරීක්ෂණයක් සිදුකර අදාළ මුදල් අය කර ගත යුතු වුවත් එසේ සිදු නොකර අවිධිමත් ආකාරයට අයවිය යුතු මුදල් ගණනය කර ඇති බව කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇත.

නිගමනය :-

මු.රෙ.104 පරීක්ෂණයක් මඟින් පැමිණිලිකාරියගෙන් රජයට අයවිය යුතු මුදලක් තිබේ නම් ඒ සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව තිබියදී, එතෙක් පැමිණිලිකාරිය සේවය කළ මාස 09 සඳහා ගෙවිය යුතු වැටුප් නොගෙවා සිටීම මඟින් පැමිණිලිකාරියට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) වගන්තිය මඟින් සහතික කොට දී ඇති නීතිය ඉදිරියේ සමාන ලෙස සැලකිලි ලැබීමට ඇති මූලික අයිතිවාසිකම වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. පැමිණිලිකාරියට ගෙවිය යුතු මාස 09 ක වැටුප් වහාම ගෙවීමට කටයුතු කිරීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. එසේම ආයතන සංග්‍රහයට පටහැනි ලෙස කටයුතු කළ නිළධාරීන් සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගත යුතු බවට ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021. 06 . 21 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/